**විසර්ජන ශීර්ෂය 119 විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය**

---

**විගණකාධිපති වාර්තාව - 2011 වර්ෂය**

---

## 1.1 විගණන විෂය පථය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 ඔක්තෝබර් 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 36,259 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 26,195 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.මිලියන 10,064 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම විස්තරය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ශුද්ධ ප්‍රතිපාදනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **%** |
| පුනරාවර්තන | 1,409.990 | 895.601 | 215.428 | 24 |
| මූලධන | 32,704.650 | 35,363.215 | 9,848.659 | 28 |
| **එකතුව** | **34,114.640** | **36,258.816** | **10,064.087** | |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 11901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| 5,800,000 | 2,240,282 | 2,500,000 | 3,053,432 | 31,000,000 | 12,558,610 |

**2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

(අ) **අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ රු. 16,130,664 ක් වූ හර ශේෂයක් තිබුණි.

(ආ) **පොදු තැන්පත් ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු. 13,461,534 ක් වූ අතර ඒ පිළිබඳව විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.** |
| 6000-0000-00-0003-0034 | 12,882,241 |
| 6000-0000-00-0015-0032 | 579,293 |
| එකතුව | 13,461,534 |

## 2.4 ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.5 සිට 2.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

සංවර්ධන වැඩසටහන යටතේ වැය විෂයයන් 08 කට එකතුව රු. මිලියන 3,555 ක ප්‍රතිපාදන සලසා තිබුණි. අත්තිකාරම් ගෙවීම ප්‍රමාද වීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම නිසා එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

### (ආ) සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් ආවරණය වන පරිදි පිළියෙල කල යුතු සංයුක්ත සැලැස්ම අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබුණි.

***විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ කටයුතු සම්බන්ධයෙන් 2012 සැප්තැම්බර් 21 දින පාර්ලිමේන්තුවේ පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවට සහභාගී වූ මුදල් අමාත්‍යාංශ නියෝජිතයා විසින් පෙන්වා දෙනු ලැබුයේ රේඛීය අමාත්‍යාංශ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවට දැනටමත් මුදල් අමාත්‍යාංශය තීරණය කර ඇති බවත් එම උපදෙස් ඉතා කඩිනමින් චක්‍රලේඛ මගින් සියලු අමාත්‍යාංශවලට දැන්වීමට කටයුතු කරන බවත්ය. එම අදහස් දැක්වීමට කමිටුවේද එකඟත්වය ලැබුණු බැවින් ඒ අනුව මෙම අමාත්‍යාංශය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව අමාත්‍යාංශයේ ලේකම්වරයා දක්වා තිබුණි.***

**(ඈ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

2011 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය සඳහා ක්‍රියාකාර සැලැස්මක් 2012 දෙසැම්බර් මස පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 11901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.865,393 ක් වූ අතර, ඒ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නිලධාරියකුගේ හිඟ ණය ශේෂ මුළුමනින්ම පියවා ගැනීමකින් තොරව වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත නොකල යුතු බව ආයතන සංග්‍රහයෙ xxiv පරිච්ඡේදයේ 3.18.1 වගන්තියෙන් අවධාරණය කර තිබුණත්, ඊට පටහැනිව රු16,375 ක ණය ශේෂයක් අයකර ගැනීමට තිබූ නිලධාරියෙකුට 1992 වර්ෂයේදී වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කර තිබුණු අතර එම ණය ශේෂය 2011 දෙසැම්බර් 31 දිනවන විටද අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.188,470 ක ණය ශේෂ අය කර ගැනීම සඳහා අමාත්‍යාංශය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 2.5 අනුකූල නොවීම

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | |
| (i) මු.රෙ.104 | 927,455 | වාහන අනතුරු 11 කට අදාලව දරන ලද රු. 1,534,166 ක් වූ අලාභයෙන් රු.606,711 ක් රක්ෂණාවරණයෙන් ලැබී තිබුණ අතර රු.927,455 ක් වූ ඉතිරිය භාණ්ඩාගාර |

අනුමැතියකින් තොරව සහ ප්‍රමාණවත් හේතු දැක්වීමකින් තොරව පොත්වලින් කපා හැර තිබුණි.

(ii) මු.රෙ. 625(අ) 200,000,000 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ කොරියානු රජයේ ද්‍රව්‍ය ආධාරවලින් ක්‍රියාත්මක වූ හම්බන්තොට සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා ද වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු අතර 2011 වර්ෂය තුල ලැබුණු රු.මි.200 ක් පමණ වන ආධාරවල වටිනාකම විසර්ජන ගිණුමෙන් අතහැර තිබුණි.

## 2.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

**(i)** ජ්ප් රථයේ එන්ජිමේ උෂ්ණත්වය වැඩිවීම පෙන්නුම් කර තිබියදීත් 2007 ජුලි 01 දින මහනුවර සිට කොළඹ පිහිටි අමාත්‍යාංශ කාර්යාලය තෙක් අඛණ්ඩව වාහනය ධාවනය කිරීම හේතුවෙන් විනාශ වූ එන්ජිම අලුත්වැඩියා කිරීම සඳහා අමාත්‍යාංශය රු.473,880 ක අලාභයක් සිදු කිරීම සම්බන්ධයෙන් මු.රෙ. 102,104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2008 ජුනි 03 දින අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් බස් රථයක ගැටීමෙන් වූ රු.407,880 අලාභයෙන් රු.310,142 ක් අමාත්‍යංශයට රක්ෂණාවරනයෙන් ලැබී ඇති අතර ඉතිරි රු.97,738 සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කිරීමට අභ්‍යන්තර විගණකගේ සහභාගීත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීමට වසර 04 කට පසුව තීරණය කිරීම හා වෙනත් රක්ෂණ ආයතනයකින් ඉතිරි අලාභය අයකර ගැනීමට තීරණය කිරීම විගණනයේදී පිළිගත නොහැකි විය.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 16* | 02 |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | තෘතියික මට්ටම | 49 | 41 | 08 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 47 | 40 | 07 |
| | **එකතුව** | **114** | **97** | **17** |

* අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාමික නිලධාරියෙකුගෙන් පුරවන ලද අතිරේක ලේකම් (තාක්ෂණ) තනතුර සහ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරියෙකුගෙන් පුරවන ලද අතිරේක ලේකම් (සැලසුම් හා සංවර්ධන) තනතුර මීට ඇතුලත් කර ඇත.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස ලබා ගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| **සේවක වර්ගය** | **සංඛ්‍යාව** | **වෙනත් පාර්ශවය** | **කාලපරිච්ඡේදය (ලබා ගත් වර්ෂය)** |
|---|---|---|---|
| මාණ්ඩලික | 01 | ලංකා විදුලිබල මණ්ඩලය | 2008 |
| මාණ්ඩලික නොවන | 01 | ලංකා විදුලිබල මණ්ඩලය | 1994 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 01 | එම | 2003 |
| මාණ්ඩලික නොවන | 02 | එම | 2008 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 03 | එම | 2009 |
| මාණ්ඩලික නොවන | 02 | එම | 2010 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 03 | එම | 2010 |
| එම | 01 | මහවැලි සංවර්ධන අධිකාරිය | 2010 |
| මාණ්ඩලික නොවන | 01 | ලංකා විදුලිබල මණ්ඩලය | 2011 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 07 | එම | 2011 |
| | 22 | | |

**(i)** විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශ සේවය සඳහා යොදවාගෙන ඇති මහවැලි සංවර්ධන අධිකාරියට අයත් රියදුරෙකුගේ 2010 ඔක්තෝබර් සිට 2011 දෙසැම්බර්

දක්වා වැටුප් හා දීමනා, අතිකාල, ගමන් වියදම් ඇතුළු මුළු පාර්ශ්‍රමිකය වූ රු.745,278 විදුලිබල මණ්ඩලයෙන් මහවැලි අධිකාරියට ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ii) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.4 ඡේදයට අනුකූල නොවන පරිදි අමාත්‍යාංශය අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව පිළිවෙලින් මහවැලි සංවර්ධන අධිකාරියේ එක් නිලධාරියෙකු සහ ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් 21 අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවා ගෙන තිබුණි. ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරි 21 දෙනාගෙන් 8 දෙනෙකු 2011 වර්ෂයේදී නව පත්වීම් ලැබ එදින සිටම අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණි. එලෙස අමාත්‍යාංශයට අනුයුක්ත නිලධාරීන් වෙනුවෙන් 2011 දෙසැම්බර් මසට පමණක් විදුලිබල මණ්ඩලය විසින් දරන ලද පාර්ශ්‍රමිකයින්ගේ වටිනාකම රු.1,047,878 ක් විය.

## 2.8 අභ්‍යන්තර පාලනය

--------------------

**විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------

පසු ගිය වසර හතර තුළ විගණන හා කළමනාකරණ කමිටු සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.